# දෙවන වාර පරීක්ෂණය
# නර්තනය
## 8 ශ්‍රේණිය

**කාලය පැය 02**

නම :- ..............................................................................................................................

## I කොටස

අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01) හස්ත හා පාද චලන හුරුවීම සඳහා පිළිවෙලින් උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් වලදී නටනු ලබයි.

i. පා සරඹ, මණ්ඩි පද, ඉලංගම් සරඹ

ii. ගොඩ සරඹ, දොඹින පද, පා සරඹ

iii. පා සරඹ, ගොඩසරඹ හා මණ්ඩි පද

iv. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද

02) ඇල සරඹය ලෙස හඳුන්වනු ලබන්නේ,

i. හයවන ගොඩ සරඹයි.

ii. පස්වන ගොඩ සරඹයි.

iii. තුන්වන පා සරඹයි.

iv. දෙවන ගොඩසරඹයි.

03) "සූරිය කුල ඇති හිරු දෙවියන්නේ" මෙම කවිය අයත් වන්නේ,

i. ලී කෙලි නැටුමටයි.

ii. පතුරු නැටුමටයි.

iii. ගොයම් නැටුමටයි.

iv. සවරන් නැටුමටයි.

04) ලී කෙලි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුමකි,

i. චෙම්බු

ii. කාවාඩි

iii. කොහොඹ කළය

iv. කෝලාට්ටම්

05) සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශයකි,

i. රත්නපුරය

ii. කුරුණෑගල

iii. කළුතර

iv. ගාල්ල

06) පහතරට බෙරය හඳුන්වන නම් කිහිපයකි,

i. ගැටබෙරය, දවුල, පහතරට බෙරය

ii. පහතරට බෙරය, රුහුණු බෙරය, යක් බෙරය

iii. දෑත හරි බෙරය, උඩැක්කිය

iv. පනා බෙරය, යක්බෙරය, බුම්මැඩිය

07) තනි තිතෙහි ප්‍රභේද ගණන,

i. 01 කි.

ii. 2 කි.

iii. 3 කි.

iv. 4 කි.

08) වෛරෝඩි වන්නමට අයත් බෙරපදය වන්නේ,

i. කුඳ ගත ගත දොම් ii. ජිං ගත ගො ගො iii. දොම් කිට කිට දොම්

iv. දොම් ජිංත ගත දොංත

09) ගැටබෙරයෙන් වාදනය වන මූලික බීජාක්ෂර ගණන,

i. 6 කි. ii. 4 කි. iii. 16 කි. iv. 3 කි.

10) නවරාත්‍රී උත්සවය පවත්වනු ලබන්නේ,

i. හින්දු බැතිමතුන් ii. මුස්ලිම් බැතිමතුන් iii. කතෝලික බැතිමතුන්

iv. බෞද්ධ බැතිමතුන්

(1x10)

පහත සඳහන් වාක්‍ය හරි නම් (✓) ලකුණද බැවරදි නම් (X) ලකුණද වරහන් තුළ යොදන්න.

11) සත්ව චරිත නිර්මාණයේදී ඒ ඒ සතුන්ට ආවේණික ලක්ෂණ චලන නිර්මාණ වල දැකිය හැකිය. ( )

12) භය නැමැති ස්ථායීභාවය තුළින් හාස්‍ය රසය උත්පාදනය වේ. ( )

13) නර්තන කලාව පිළිබඳ තොරතුරු සොයා ගත හැකි මූලාශ්‍රයකි රූකම් ( )

14) "මල් ගවසාලා කොණ්ඩය බැඳලා" මෙම කවි පදය අයත් වන්නේ කලගෙඩි නැටුමටය. ( )

15) තුරඟා වන්නම සුලු මැඳුම් දෙතිතට අයත් වන්නමකි. ( ) (1x5)

16-20 දක්වා ඇති වචන වලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(චරිත නිරූපන, කැටයම්, දුර්ග දෙවියන්, පා සරඹ, ටින්බෙරය, ගොඩ සරඹ, අවනද්ධ භාණ්ඩ)

16) නවරාත්‍රී උත්සවය - ..........................................................

17) භාව ප්‍රකාශන - ..........................................................

18) ගොප් කොළ - ..........................................................

19) දණ්ඩි කඳ - ..........................................................

20) විකල්ප භාණ්ඩ - .......................................................... (1x5)

## II කොටස

පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

(01) i. මාත්‍රා 3+3 තාලයට අයත් වන්නමක් නම් කරන්න.

ii. මාත්‍රා 3+3 තාල රූපයට අයත් බෙර පදයක් ප්‍රස්ථාර ගත කරන්න.

iii. ඉහත නම්කළ වන්නමට අදාල එක් කවියක් ලියා දක්වන්න.

(02) i. ගැටබෙරයේ වාදනය කරන සතර බීජාක්ෂර ලියා දක්වන්න.

ii. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාදය භාණ්ඩය නම් කර එය සකස් කිරීමට ගන්නා සම් වර්ගයක් හා ලී වර්ගයක් නම් කරන්න.

iii. ඉහත නම් කරන ලද වාද්‍ය භාණ්ඩයේ රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.

(03) i. නර්තන කලාව පිළිබඳ තොරතුරු සොයා ගත හැකි මූලාශ්‍ර 02ක් නම් කරන්න.

ii. ඔබ දන්නා රූකම් වර්ග 02ක් හා ඒවා දක්නට ලැබෙන ස්ථාන 02ක් නම් කරන්න.

iii. දැනට පවතින රූකම් ආරක්ෂා කරගැනීම සඳහා යෝජනා 02ක් ඉදිරිපත් කරන්න.

(04) i. ඔබ දන්නා ජන නැටුම් 05ක් නම් කරන්න.

ii. ඉහත නම් කරන ලද ජන නැටුමකට අයත් කවියක් ලියා දක්වන්න.

(05) i. ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් 03 නම් කරන්න.

ii. ඉහත නම් කළ සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ 02 බැගින් ලියා දක්වන්න.

iii. ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය නම් කර එහි ප්‍රධාන ශාන්ති කර්මය හා එය පැවැත්වීමේ අරමුණු 03ක් ලියා දක්වන්න.